00074

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා ) උපාධි වැඩසටහන - පස්වන මට්ටම**

**අවසාන පරීක්ෂණය - 2014**

**ESU3225 - අධ්‍යාපන මනෝවිද්‍යාව**

**කාලය - පැය තුනයි.**

---

**දිනය - 2014.02.24** **වේලාව - පෙ.ව.09.30 - ප.ව. 12.30**

---

**I වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, II වන කොටසේ ඕනෑම ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

**I වන කොටස**

01. අධ්‍යාපන මනෝ විද්‍යාවට අදාළව, ගුරුවරයකුගේ ප්‍රධාන භූමිකා තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

02. 'සමස්ත සංවර්ධනය' යනු කුමක් ද?

03. ළමයකුගේ 'පරිණතිය' සහ 'ඉගෙනුම' අතර පවතින සම්බන්ධතාව සැකෙවින් දක්වන්න.

04. 'සූදානම' යන සංකල්පය නිදසුන් දෙකක් (02) දක්වමින් සාකච්ඡා කරන්න.

05. පියාජේ විසින් හඳුන්වා දුන් සංවර්ධන අවධි අතුරින් තෝරාගත් ඕනෑ ම අවධියක ප්‍රධාන ලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න.

06. 'පෙළඹීම' යන්න නිර්වචනය කරන්න.

07. පාඩම පුරා ම ශිෂ්‍ය අවධානය පවත්වා ගැනිම සඳහා ගුරුවරයෙකුට භාවිත කළ හැකි ක්‍රම ශිල්ප තුනක් (03) විස්තර කරන්න.

08. ආත්මකේන්ද්‍රීය චින්තනය හේතුවෙන් නවයොවුන් වියේ පසුවන පුද්ගලයන් මුහුණ දෙන ගැටලු තුනක් (03) සාකච්ඡා කරන්න.

( ලකුණු 5 x8 = 40 )

## II වන කොටස

09. (i) ප්‍රජානන සංවර්ධන ක්‍රියාවලිය සැකෙවින් දක්වන්න. (ලකුණු 05)

(ii) ප්‍රජානන සංවර්ධනය කෙරෙහි බලපාන සාධක දෙකක් (02) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) ශිෂ්‍යයන්ගේ ප්‍රජානන සංවර්ධනය සඳහා ගුරුවරයෙකුට සහය විය හැක්කේ කෙසේදැයි පෙන්වා දෙන්න. (ලකුණු 07)

10. (i) පෙළඹීම පිළිබඳ ෆ්‍රොයිඩ්ගේ 'මනෝවිශ්ලේෂණවාදී න්‍යාය' කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(ii) ඉගෙනුම කෙරෙහි ස්වයං පෙළඹීමේ ඇති වැදගත්කම පෙන්වා දෙන්න. (ලකුණු 06)

(iii) ශිෂ්‍යයන් ඉගෙනුම කරා පෙළඹවීම සඳහා වන ගුරු භූමිකාව සාකච්ඡා කරන්න. (ලකුණු 08)

11. (i) ප්‍රධාන ඉගෙනුම් න්‍යාය කාණ්ඩ තුන (03) දක්වා එම න්‍යාය කාණ්ඩ තුන අතර පවතින අසමානතා කෙටියෙන් විමසන්න. (ලකුණු 06)

(ii) එක් කාණ්ඩයකින් එකක් (01) බැගින් වනසේ එම කාණ්ඩවලට අයත් න්‍යායයක් තෝරාගෙන එම න්‍යායයන් හි ප්‍රධාන මූලධර්ම වෙන වෙන ම සාකච්ඡා කරන්න. (න්‍යායයන් 3 කට අදාලව සාකච්ඡා කළයුතුව ඇත.) (ලකුණු 08)

(iii) ඉහත න්‍යායයන් අතුරින් ඕනෑ ම එකක ප්‍රධාන මූලධර්ම පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට යොදාගත හැකි ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 06)

12. (i) 'පෞරුෂය' යනු කුමක් ද? (ලකුණු 05)

(ii) පෞරුෂ න්‍යායයක් තෝරාගෙන, පෞරුෂ සංවර්ධනයට අදාලව එම මූලධර්මවල වැදගත්කම පරීක්ෂා කරන්න. (ලකුණු 07)

(iii) ශිෂ්‍යයන් තුළ සමබර පෞරුෂයක් ඇති කර ගැනීම සඳහා ගුරුවරයාගේ භූමිකාව කෙසේ විය යුතුදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 08)

13. (i) 'චිත්තවේග' යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) චිත්තවේග සහ පුද්ගල සංවර්ධනය අතර ඇති සබඳතාව කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 07)

(iii) ශිෂ්‍යයන් තුළ සමබර චිත්තවේග සංවර්ධනයට ගුරුවරයෙකුට සහය විය හැක්කේ කෙසේදැයි දක්වන්න.

(ලකුණු 08)

14. පහත දැක්වෙන තේමාවලින් ඕනෑ ම තුනක් (03) සඳහා කෙටි සටහන් ලියන්න.

(i) පුද්ගලයකුගේ සංවර්ධනය කෙරෙහි ආරයෙහි සහ පරිසරයෙහි ඇති බලපෑම.

(ii) ශිෂ්‍ය චර්යාව අධ්‍යයනය සඳහා භාවිත කළ හැකි පර්යේෂණාත්මක ක්‍රමය හා පර්යේෂණාත්මක නො වන ක්‍රම අතර ඇති වෙනස්කම්

(iii) නවයොවුන්වියේ සමාජයීය සංවර්ධනය

(iv) බෲනර්ගේ ප්‍රජානන සංවර්ධන න්‍යාය

(ලකුණු 6 x 3 +2 = 20 )

(මුළු ලකුණු 100)

හිමිකම් ඇවිරිණි.



9